# මානව අයිතිවාසිකම් මහ කොමසාරිස් කාර්යාලය ශ්‍රී ලංකාවේ වගවීමේ ව්‍යාපෘතිය

# කාර්ය නිර්දේශය

1. 2021 මාර්තු 23 දින ''ශ්‍රී ලංකාවේ සංහිඳියාව, වගවීම සහ මානව අයිතිවාසිකම් ප්‍රවර්ධනය කිරීම පිළිබඳ මානව අයිතිවාසිකම් කවුන්සලයේ 46/1 යෝජනාවෙන් වගවීම ප්‍රවර්ධනය කිරීමේ අදහසින් මානව අයිතිවාසිකම් උල්ලංඝනය කිරීම් සහ අපහරණයට අදාල සාක්ෂි සංරක්ෂණය කිරීමේ සහ විශ්ලේෂණය කිරීමේ වැදගත්කම පිළිගත් නිසා මේ සම්බන්ධයෙන් එක්සත් ජාතීන්ගේ මානව අයිතිවාසිකම් මහ කොමසාරිස් කාර්යාලයේ හැකියාවන් ශක්තිමත් කිරීමට තීරණය කරන ලදී.

2. මෙම අධිකාරියට අනුකූලව මානව අයිතිවාසිකම් මහ කොමසාරිස් කාර්යාලය මානව අයිතිවාසිකම් මහ කොමසාරිස් ගේ බලයට යටත්ව එම කාර්යාලයේම ශ්‍රී ලංකාව පිළිබඳ වගවීමේ ව්‍යාපෘතියක් ස්ථාපනය කර ඇත.

**අධිකාරිය**

3. යෝජනා 46/1 ඡේදය 6 අනුව ශ්‍රී ලංකාවේ බරපතළ මානව අයිතිවාසිකම් උල්ලංඝනය කිරීම් සහ අන්තර්ජාතික මානුෂීය නීතීන් බරපතළ උල්ලංඝනය කිරීම් අනාගතයේ වගවීමේ ක්‍රියාපටිපාටි සඳහා ගත හැකි උපාය මාර්ග වර්ධනය කිරීමට, තොරතුරු සහ සාක්ෂි රැස් කිරීමට, තහවුරු කිරීමට, සම්පිණ්ඩනය, විශ්ලේෂණය සහ සංරක්ෂණයට, වින්දිතයන් සහ දිවි ගලවා අය වෙනුවෙන් පෙනී සිටීමට, නිසි අධිකරණ බලයක් ඇති රාජ්‍යයන් ඇතුළත් අදාල අධිකරණමය සහ වෙනත් ක්‍රියා පටිපාටින්ට සහායවීමට මානව අයිතිවාසිකම් මහ කොමසාරිස් කාර්යාලයේ හැකියාවන් විශේෂිතවම ශක්තිමත් කිරීමට තීරණය කරන ලදී.[1]

4. මෙම අධිකාරිය ක්‍රියාත්මක කිරීමේ දී සහ එක්සත් ජාතීන්ගේ මහ ලේකම් කාර්යාලයට අදාල වන නීතිමය රාමුවට අනුකූලව ශ්‍රී ලංකාවේ තත්වය සම්බන්ධයෙන් කිසියම් වින්දිතයෙකු සියලුම පාර්ශ්වයන්ට එරෙහිව කරන උල්ලංඝනය කිරීම් සහ අපහරණ සැලකිල්ලට ගැනීමේ දී වෘත්තීයමය නිපුණතාවය, ස්වාධීනත්වය, අවංකත්වය සහ අපක්ෂපාතිත්වය ඇතිව මානව අයිතිවාසිකම් මහ කොමසාරිස් කාර්යාලය ක්‍රියා කරනු ඇත. මානව අයිතිවාසිකම් මහ කොමසාරිස් කාර්යාලය වින්දිතයන් සහ දිවි ගලවා ගත අය වෙනුවෙන් පෙනී සිටීම සම්බන්ධයෙන් ඇතුළත්ව යුක්තිය, සත්‍යය, හානිපූරණය සහ නැවත සිදුනොවීමේ සහතිකයට වින්දිතයන්ට ඇති අයිතිවාසිකම සහ වගවීමේ පියවර තහවුරු කිරීමට අධිකරණමය සහ අධිකරණ නොවන ක්‍රියා පටිපාටින් ඇතුළත්ව අතීතය ගැන කටයුතු කිරීමේ දී විස්තීර්ණ පිවිසුමක වැදගත්කම අවධාරණය කරමින් සිය අධිකාරිය ක්‍රියාත්මක කරනු ඇත. මෙම ව්‍යාපෘතිය එහි සියලු වැඩ කටයුතුවලදී අදාල ස්ත්‍රී පුරුෂ සමාජභාවීය දැක්ම සහ අනුබද්ධිත කරුණු මෙන්ම ළමයින් සහ ඔවුන්ගේ ප්‍රශස්තම වුවමනාවන් විස්තීර්ණව සහතික කිරීම අරමුණු කර ගත් පිවිසුමක් පූර්ණ වශයෙන්ම අනුකලනය කොට සහතික කරනු ඇත.

5. වගවීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ දී මානව අයිතිවාසිකම් මහ කොමසාරිස් කාර්යාලය පවතින කාර්ය නිර්දේශය, එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තිය, අදාල අන්තර්ජාතික නීති සහ එක්සත් ජාතින්ගේ නියමයන්, රෙගුලාසි සහ ප්‍රතිපත්තිවලට සම්පූර්ණයෙන්ම අනුකූලව කටයුතු කරනු ඇත. එය හැකිතාක් දුරට ගැලපෙන ආකාරයට අදාල අන්තර්ජාතික වගවීමේ යාන්ත්‍රණයන් හි ප්‍රතිපත්ති සහ භාවිතාවන් සැලකිල්ලට ගනු ඇත. මානව අයිතිවාසිකම්

[1] මෙම විෂය නිර්දේශය යෙදෙන්නේ 46/1, 51/1 සහ පසුව කෙරෙන යෝජනාවන්ට අනුකූල මානව අයිතිවාසිකම් මහකොමසාරිස් කාර්යාලයේ අධිකාරිය වෙනුවෙනි.

කවුන්සලයේ යෝජනා 46/1 ඡේදය 6, යෝජනා 51/1 ඡේදය 8 සහ අනතුරුව ඇති අධිකාරීන්ට අනුකූලව එක්සත් ජාතීන්ගේ නේවාසික සම්බන්ධීකාරක සහ ශ්‍රී ලංකාවේ දේශීය කණ්ඩායමෙන් ස්වාධීනව සිදු කරනු ඇත. මෙම ව්‍යාපෘතියට සම්බන්ධිත වර්ධනයන් මානව අයිතිවාසිකම් කවුන්සලයට ඉදිරිපත් කරන මානව අයිතිවාසිකම් මහ කොමසාරිස් කාර්යලයේ වාර්තා මෙන්ම වාචික යාවත්කාලීන කිරීම් සහ වෙනත් ගැලපෙන ප්‍රකාශයට පත් කර ඇති දේ වලින් ලබා ගන්නා කරුණු ඇතුළත් වනු ඇත.

.

## II. තොරතුරු සහ සාක්ෂි රැස්කිරීම, සම්පිණ්ඩනය, විශ්ලේෂණය සහ සංරක්ෂණය

### අ. රැස්කිරීම

6. මානව අයිතිවාසිකම් මහ කොමසාරිස් කාර්යාලයට වගවීමේ ව්‍යාපාතිය හරහා ශ්‍රී ලංකාවේ සියලු පාර්ශ්වයන් විසින් සිදු කරන ලද බරපතළ මානව අයිතිවාසිකම් උල්ලංඝනය කිරීම් සහ බරපතළ අන්තර්ජාතික මානුෂීය නීති උල්ලංඝනය කිරීම්වලට අදාල තොරතුරු සහ සාක්ෂි රැස් කිරීමට අධිකාරියක් ලැබී ඇත. එය,

අ. අදාල අනුමැතියේ සීමාවන් තුළ අදාල තොරතුරු ලබා දෙන්නන් විසින් යොදන කොන්දේසි, එක්සත් ජාතීන්ගේ නියමයන්, රෙගුලාසි සහ ප්‍රතිපත්ති යටතේ සංවේදී කරුණුවලට සහ වෙනත් සීමාවන්ට යටත්ව මානව අයිතිවාසිකම් කවුන්සලයේ යෝජනා 25/1 විසින් අධිකාරිය ලබා දුන් මානව අයිතිවාසිකම් මහ කොමසාරිස් කාර්යාලයේ විමර්ශනයෙන් රැස් කරන ලද තොරතුරු සහ සාක්ෂි යොදා ගැනීමට සහ ඒවා වර්ධනය කිරීම සඳහා පිවිසීම ඉල්ලා සිටිනු ඇත.

ආ. එක්සත් ජාතීන්ගේ පද්ධතියේ අදාල ආයතන සහ යාන්ත්‍රණයන් ඇතුළත්ව, ශ්‍රී ලංකාවේ වගවීම පිළිබඳ එක්සත් ජාතින්ගේ විශේෂඥ මණ්ඩලය, ජාතික බලධාරීන්, අන්තර්ජාතික, කලාපීය හෝ ජාතික සංවිධාන හෝ ආයතන, රාජ්‍ය නොවන සංවිධාන, වෙනත් රාජ්‍ය නොවන, සංස්ථාපිත හෝ පුද්ගලික අංශයේ ආයතන හෝ වෙනත් කණ්ඩායම් හෝ පුද්ගලයන් ඇතුළත්ව කිසියම් හෝ සියලු මූලාශ්‍රවලින් අනුමැතියට අදාල සීමාවන් තුළ අදාල තොරතුරු ලබා දෙන්නන් විසින් පනවන කොන්දේසි සහ එක්සත් ජාතීන්ගේ නියමයන්, රෙගුලාසි සහ ප්‍රතිපත්ති යටතේ සංවේදී කරුණුවලට අදාලව තොරතුරු සහ සාක්ෂි රැස් කරනු ඇත.

ඇ. අදාල ප්‍රමිතීන්ට සහ ක්‍රමවේදයන්ට ගැලපෙන සහ අනුකූල වන ආකාරයට සම්මුඛ සාකච්ඡා සාක්ෂිකරුවන්ගේ ප්‍රකාශ, ප්‍රලේඛන ගත කිරීම් සහ අදාල වෙනත් කරුණු ඇතුළත් අතිරේක තොරතුරු සහ සාක්ෂි රැස් කරනු ඇත.

### ආ. සම්පිණ්ඩනය සහ විශ්ලේෂණය

7. වගවීමේ ව්‍යාපෘතිය, ජාතික, කලාපිය හෝ අන්තර්ජාතික කුමන හෝ මට්ටම්වලදී අන්තර්ජාතික ප්‍රමිතීන්ට අනුකූලව වඩාත් පහසුවෙන් ලබා ගැනීම, අදාලත්වය සහ අනාගත වගවීමේ ක්‍රියාවලීන් හි යොදා ගැනීමේ අදහසින් එය සතුව ඇති තොරතුරු සහ සාක්ෂි, සම්මුඛ සාකච්ඡා, සාක්ෂිකරුවන්ගේ ප්‍රකාශ, ප්‍රලේඛන සහ අදාල අනෙකුත් සියලු දේ සුදුසු ආකාරයට සංවිධානය කිරීම, තක්සේරු කිරීම සහ ව්‍යුහගත කරනු ඇත.

8. වගවීමේ ව්‍යාපාතිය සිදු කරන විශ්ලේෂණයට සාක්ෂිවල පැවතිය හැකි හිඩැස් සහ අතිරේක තොරතුරු සහ සාක්ෂි රැස් කිරීමේ අවශ්‍යතාවය හඳුනා ගන්නා අතර නිරවද්‍ය විශ්වසනීයත්වය, ප්‍රබලත්වය සහ ඒෂණීය වටිනාකම සඳහා එය සතුව ඇති තොරතුරු සහ සාක්ෂි පූර්ව තක්සේරුවකට ඇතුළත් වනු ඇත.

**ඇ. සංරක්ෂණය**

9. වගවීමේ ව්‍යාපෘතිය හරහා මානව අයිතිවාසිකම් මහ කොමසාරිස් කාර්යාලය තොරතුරු සහ සාක්ෂි රක්ෂිතාගාරයක් නිර්මාණය කරනු ඇත. එමෙන්ම තමන් සතුව ඇති තොරතුරු සහ සාක්ෂි තොරතුරු රැස් කිරීමේ ප්‍රලේඛනය කිරීමේ සහ කළමනාකරණයේ මානව අයිතිවාසිකම් මහ කොමසාරිස් කාර්යාලයේ ක්‍රමවේදයට සහ අදාල තැන්වලදී ගැලපෙන අන්තර්ජාතික වගවීමේ යාන්ත්‍රණයන් හි ප්‍රතිපත්ති සහ භාවිතා අනුව තමන් සතුව ඇති තොරතුරු සහ සාක්ෂි වාර්තා කිරීම, සංවිධානය සහ සංරක්ෂණය කරනු ඇත.

10. වගවීමේ ව්‍යාපෘතිය එහි අධිකාරය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය ආකාරයට තමන් සතුව ඇති සාක්ෂිවල නිර්බාධිත භාරකාරත්ව දාමය හැකි උපරිම දුරට පවත්වා ගැනීම සහතික කරනු ඇත.

11. වගවීමේ ව්‍යාපෘතිය එක්සත් ජාතීන්ගේ මහ ලේකම් කාර්යාලයට යෙදෙන නීති රාමුවට අනුකූලවන ආකාරයට, සුරක්ෂිත භාවය සහ රහස්‍යභාවයට යෙදෙන සහතික කිරීම්වලට පූර්ණ ගරුත්වය ඇතිව සහ එක්සත් ජාතීන්ගේ වරප්‍රසාද සහ මුක්තීන් ඇතුළත්ව, එය රැස් කරන තොරතුරු සහ සාක්ෂි සංරක්ෂණය කිරීමේ දී, පරිහරණය කිරීමේ දී ගබඩා කිරීමේ දී නිසි සුරක්ෂිත භාවයක් තහවුරු කරනු ඇත.

12. වගවීමේ ව්‍යාපෘතිය ආරම්භයේ සිටම එක්සත් ජාතීන්ගේ මහ ලේකම් කාර්යාලයට යෙදන නීති රාමුවට අනුකූල වන ආකාරයට සහ තොරතුරු ලබා දෙන්නන් විසින් නියම කරන කොන්දේසිවලට යටත්ව, අධිකාරය සම්පූර්ණ කිරීමෙන් පසුව රක්ෂිතාගාරයක දීර්ඝ කාලීන ගබඩා කිරීම සහ ඊට පිවිසීම නියාමනය සඳහා ගැලපෙන ක්‍රියා පටිපාටි ගොඩ නැගීම හරහා ඇතුළත්ව දේවල් රක්ෂිතාගාර කිරීම සහ සන්තකයේ තබා ගැනීමට ගැලපෙන සංවිධානයක් සහතික කිරීම.

## III අනාගත වගවීමේ ක්‍රියාවලීන් සඳහා යොදා ගත හැකි උපාය මාර්ග ගොඩ නැගීම

13. මානව අයිතිවාසිකම් මහ කොමසාරිස් කාර්යාලය වගවීමේ ව්‍යාපෘතිය හරහා අදාල පාර්ශ්වකරුවන් සමග ප්‍රවීන විමර්ශනාත්මක, අභිචෝදනා සහ/හෝ අධිකරණ බලධාරීන්, රාජ්‍ය නොවන සංවිධාන සහ සිවිල් සමාජ සංවිධාන, වින්දිතයන් සහ ඔවුන්ගේ නීති නියෝජිතයන් ඇතුළත්ව, ශ්‍රී ලංකාවේ බරපතළ මානව අයිතිවාසිකම් උල්ලංඝනය කිරීම් සහ බරපතළ අන්තර්ජාතික නීතිය උල්ලංඝනය කිරීම් සඳහා අනාගත වගවීමේ ක්‍රියාවලියක් සඳහා යොදා ගත හැකි උපාය මාර්ග ගොඩ නගනු ඇත.

14. අන්තර්ජාතික, කලාපීය සහ ජාතික මට්ටමේ ප්‍රශස්ත භාවිතාවන් යොදා ගනිමින් අනාගත වගවීමේ ක්‍රියාවලියකට අධිකරණ සහ අධිකරණ නොවන පිවිසුම් හෝ ඒ දෙකේම එකතුවක් අන්තර්ජාතික සම්මතයන් සහ ප්‍රමිතීන්ට ගැලපෙන ආකාරයට ඇතුළත් වනු ඇත. එමෙන්ම සත්‍යයට, යුක්තියට, හානිපූරණයට සහ නැවත සිදු නොවන සහතිකයකට වින්දිතයන් ගේ අයිතිය ප්‍රවර්ධනය කිරීමේ අරමුණෙන් යුත් ප්‍රයත්නයන් ප්‍රමුඛතා ගත කරනු ඇත.

## IV. වින්දිතයන් සහ දිවිගලවා ගත් වූවන් වෙනුවෙන් පෙනී සිටීම.

15. මානව අයිතිවාසිකම් මහ කොමසාරිස් කාර්යාලය ආරම්භයේ සිටම වින්දිතයන් සහ දිවි ගලවා ගත් අය සහ ඔවුන් ගේ නියෝජිතයන් සහ ඔවුන් වෙනුවෙන් පෙනී සිටින්නන් සමග මෙම අධිකාරිය ක්‍රියාත්මක කිරීමේ දී වගවීම සහ යුක්තිය පෝෂණය සහ පහසු කිරීමේ දී ඔවුන්ගේ මූලික කාර්ය භාරය පිළිගනිමින් සහ අතීතය පිළිබඳව කටයුතු කිරීමේ දී සවිස්තරාත්මක පිවිසුමක් පැහැදිලි කරමින් ස්ත්‍රී පුරුෂ සමාජ භාවය සහ ළමා ප්‍රවීනතා පිවිසුමක් සැලකිල්ලට ගනු ඇත.

16. වින්දිතයන් සහ දිවි ගලවා ගත් අය වෙනුවෙන් පෙනී සිටීමේ දී මානව අයිතිවාසිකම් මහ කොමසාරිස් කාර්යාලය වගවීමේ ව්‍යාපෘතිය හරහා විශේෂත්වයක් හෝ වැඩි කැමැත්තක් නැතිව වින්දිතයන් සහ දිවි ගලවා ගත් අය සමග සම්බන්ධ වී වගවීම සඳහා උපාය මාර්ගයක් ගොඩ නැගීමේ දී ඔවුන්ගේ අදහස් සහ ගැටලු සැලකිල්ලට ගනු ඇත. ඒ අරමුණෙන් වගවීමේ ව්‍යාපාතිය වින්දිතයන්ගේ නියෝජිතයන් සහ සිවිල් සමාජ ක්‍රියාකාරීන් ඇතුළත් රාජ්‍ය නොවන සංවිධාන සහ වින්දිතයන් වෙනුවෙන් පෙනී සිටින්නන් සුදුසු ආකාරයට සම්බන්ධ කර ගනු ඇත.

**V අදාල අධිකරණ සහ වෙනත් ක්‍රියා පටිපාටීන්ට සහාය ලබා දීම හරහා වගවීම ප්‍රවර්ධනය කිරීම**

17. මානව අයිතිවාසිකම් මහ කොමසාරිස් කාර්යාලය සුදුසුයැයි සහ ප්‍රවීනතාවයක් ඇතැයි පෙනෙන හානිපුරණය පිළිබඳව ඇතුළත් වෙනත් අධිකරණ සහ අධිකරණ නොවන ක්‍රියාවලීන් සමග මෙම උල්ලංඝනය කිරීම් සහ අපරාධ පිළිබඳව අධිකරණ බලයක් ඇති හෝ අනාගතයේ දී බලය ලැබිය හැකි නිසි බලයක් ඇති ජාතික, කලාපීය, හෝ අන්තර්ජාතික උසාවි, විනිශ්චය සභා, හෝ විමර්ශන, අභිචෝදනා හෝ අධිකරණ බලධාරීන් සමග අන්තර්ජාතික නීති ප්‍රමිතීන්ට අනුකූල වන ආකාරයට හුවමාරු කර ගැනීමට වගවීමේ ව්‍යාපෘතිය සහාය ලබා දෙනු ඇත.

18. වෙනත් ගැලපෙන අන්තර්ජාතික වගවීමේ යාන්ත්‍රණයන්ගේ ප්‍රශස්ත භාවිතයන් සැලකිල්ලට ගන්නා අතර තොරතුරු සහ සාක්ෂි හුවමාරු කර ගැනීම එක්සත් ජාතීන්ගේ මහ ලේකම් කාර්යාලයේ නියමයන්, රෙගුලාසි සහ ප්‍රතිපත්ති, අදාල අන්තර්ජාතික නීතිය සහ මානව අයිතිවාසිකම් මහ කොමසාරිස් කාර්යාලයේ අභ්‍යන්තර මාර්ගෝපදේශ සහ ක්‍රියා පටිපාටිවලට අනුකූලව සිදු කරනු ඇත.

19. ගැලපෙන සහ ප්‍රවීනයැයි පෙනෙන හානිපූරණය ඇතුළත්ව වෙනත් අධිකරණ සහ අධිකරණ නොවන ක්‍රියාවලීන් සමග අදාල ප්‍රවීනත්වයක් ඇති ජාතික, කලාපීය හෝ අන්තර්ජාතික උසාවි, විනිශ්චය සභා හෝ විමර්ශන, අභිචෝදනා හෝ අධිකරණ බලධාරීන් සමග අදාල තොරතුරු සහ සාක්ෂි හුවමාරු කර ගැනීම සැලකිල්ලට ගත හැකිය.

20. තොරතුරු සහ සාක්ෂි හුවමාරු කිරීම සැලකිල්ලට ගැනීමේ දී වෙනත් කරුණු අතර මූලාශ්‍ර විසින් ප්‍රකාශ කරන ලද අනුමැතියේ විෂය පථය සැලකිල්ලට ගැනීම සහ ඊට ගරුකිරීම, තොරතුරුවල හෝ සාක්ෂිවල රහස්‍යතාවය සහ වින්දිතයන්ගේ සහ සාක්ෂිකරුවන්ගේ අයිතිවාසිකම් එක්සත් ජාතීන් සතුව ඇති සංවේදී තොරතුරුවලට අදාල වෙනත් සාධක සමග සැලකිල්ලට ගනු ඇත. එය කිසියම් ආරක්ෂාවක් සහ එවැනි තොරතුරු සහ සාක්ෂි භාවිතා කිරීමෙන් පැන නැගිය හැකි වෙනත් අදාල ගැටලු තක්සේරු කරනු ඇත. හුවමාරු කර ගැනීම සඳහා දැනුවත් අනුමැතිය ලබා දී ඇති අවස්ථාවන්හිදී මානව අයිතිවාසිකම් මහ කොමසාරිස් කාර්යාලය වින්දිතයන් සහ ඔවුන්ගේ පවුල් අනවශ්‍ය අනතුරකට පත් නොකිරීම සඳහා අනතුරු තක්සේරුවක් සිදු කරනු ඇත. නැතිනම් සුදුසු සේවයකින් එවැනි තක්සේරුවක් ඉල්ලා සිටිනු ඇත.

21. වැඩි දුරටත් තොරතුරු සහ සාක්ෂි හුවමාරු කරන්නේ විශ්වසනීයත්වය සහතික කරන සහ තොරතුරු සහ සාක්ෂි කිසියම් භාවිතාවක්, වෙනත් කරුණු අතර සාධාරණ නඩු විභාගයකට ඇති අයිතිය, වින්දිතයන්ගේ අයිතිවාසිකම් සහ සාක්ෂිකරුවන්ගේ ආරක්ෂාව, අන්තර්ජාතික මානව අයිතිවාසිකම් නීතිය සහ ප්‍රමිතියට ගැලපෙන ආකාරයෙන් වනු ඇත. එක්සත් ජාතීන්ගේ ප්‍රතිපත්තියට අනුකූල වන ආකාරයට මානව අයිතිවාසිකම් මහ කොමසාරිස් කාර්යාලය මරණ දඬුවම පනවන හෝ ක්‍රියාත්මක කරන සාපරාධී නඩු ක්‍රියා පටිපාටියක යොදා ගැනීම සඳහා තොරතුරු සහ සාක්ෂි හුවමාරු කර නොගනු ඇත.

**VI ප්‍රමිතීන් සහ ක්‍රියා පටිපාටි අවශ්‍යතා**

22. වගවීමේ ව්‍යාපාතිය මානව අයිතිවාසිකම් මහ කොමසාරිස් කාර්යාලයේ සම්මත ක්‍රියා පටිපාටි සහ ක්‍රමවේදයට අනුකූලව වැඩ කිරීමේ ක්‍රියා පටිපාටි, ක්‍රියාවලීන් සහ ක්‍රම වේදය පදනම්ව මානව අයිතිවාසිකම් මහකොමසාරිස් කාර්යාලයේ ජාතික, කලාපීය සහ අන්තර්ජාතික අධිකරණ ආයතන සමග සහයෝගිතාවය පිළිබඳ ක්‍රියාත්මක සම්මත ක්‍රියා පටිපාටි ඇතුළත්ව සහ රහස්‍ය සහ රහස්‍ය භාවය ඉවත් කළ වාර්තා ලබා ගැනීම පිළිබඳව මෙන්ම අදාල වන ආකාරයට මානව අයිතිවාසිකම් මහ කොමසාරිස් කාර්යාලයේ විමර්ශන ක්‍රමවේදයට යෙදෙන ආකාරයට, අදාල තැන් හිදී වෙනත් ගැලපෙන අන්තර්ජාතික වගවීමේ යාන්ත්‍රණයන්ගේ ප්‍රතිපත්ති සහ භාවිතාවන් නිසි සැලකිල්ලට ගැනීමෙන් පදනම් වනු ඇත.

23. ක්‍රියා පටිපාටි එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තිය, මානව අයිතිවාසිකම් නිතිය ඇතුළත් එක්සත් ජාතීන්ගේ නියමයන්, රෙගුලාසි, ප්‍රතිපත්ති සහ ප්‍රශස්ත භාවිතා, අදාල අන්තර්ජාතික නීතිය සහ ප්‍රමිතීන්ට අනුකූල වන ආකාරයට හැකි උසස්තම ප්‍රමිතීන් මත පදනම් වනු ඇත. මෙම ක්‍රියා පටිපාටි වින්දිතයන් කේන්ද්‍රීය, සහ ලිංගිකත්වය, ස්ත්‍රීපුරුෂ සමාජ භාවය, වයස, ආගම, වාර්ගිකත්වය සහ අන්තර්ජාතික මානව අයිතිවාසිකම් නීතිය යටතේ වෙනස් කොට සැලකීම තහනම් කළ වෙනත් සාධකවලට නිසි පරිදි සංවේදී වනු ඇත.

**VII සංයුතිය**

24. වගවීමේ ව්‍යාපාතියේ කාර්ය මණ්ඩලය, අන්තර්ජාතික මානව අයිතිවාසිකම්, මානුෂීය සහ සාපරාධි නීතිය, සංක්‍රාන්තික යුක්ති ප්‍රමිතීන් සහ ක්‍රියාවලීන් වින්දිතයන්ගේ අයිතිවාසිකම්, ස්ත්‍රී පුරුෂ සමාජ භාවීය සහ ළමා අයිතිවාසිකම් මෙන්ම තාක්ෂණ විමර්ශන පළපුරුද්ද ඇතුළත් ව්‍යාපෘතියේ අධිකාරයට ඇතුළත් වන ක්ෂේත්‍රවල නිශ්චිත විශේෂඥතාවයෙන් යුත් පුද්ගලයන්ගෙන් සහ අදාල සහායක කාර්ය මණ්ඩලයෙන් සමන්විත වනු ඇත. ව්‍යාපෘතියේ කාර්ය මණ්ඩලය එක්සත් ජාතීන්ගේ මහ ලේකම් කාර්යාලයට අදාල ප්‍රමිතීන්ට අනුකූලව භූගෝලීය විවිධත්වය, ස්ත්‍රීපුරුෂ සමාජභාවය සහ කලාපීය විශේෂඥතාවයට නිසි සැලකිල්ල යොමු කර බඳවා ගනු ඇත.

**VIII වරප්‍රසාද සහ මුක්තිය**

25. වගවීමේ ව්‍යාපෘතියේ කාර්ය මණ්ඩලය එක්සත් ජාතීන්ගේ කාර්ය මණ්ඩලය මෙන් මානව අයිතිවාසිකම් කවුන්සලයේ යෝජනා 46/1, 51/1 සහ මානව අයිතිවාසිකම් කවුන්සලය විසින් ඉදිරි කාලයේ දී සම්මත කර ගනු ලබන අධිකාරය අනුව තම කාර්ය කර ගෙන යෑමේ දී එක්සත් ජාතීන්ගේ 1946 වරප්‍රසාද සහ මුක්තීන් පිළිබඳ සන්ධානයේ වගන්ති V සහ VII යටතේ නිලධාරීන්ගේ වරප්‍රසාද සහ මුක්තීන් භුක්ති විඳිනු ඇත.

**IX අවසාන ප්‍රතිපාදන**

26. මෙම කාර්ය නිර්දේශ ඕනෑම අවස්ථාවක මානව අයිතිවාසිකම් මහ කොමසාරිස් විසින් ලිඛිතව කරනු ලබන සංශෝධනවලට යටත් ය.

27. මෙම කාර්ය නිර්දේශ මානව අයිතිවාසිකම් මහ කොමසාරිස් විසින් අනුමත කළ දිනයේ සිට විධිමත්ව බල පවත්වනු ඇත.